රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2020

මගේ අංකය : MPA/SSD/01/SSMIN/01
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.01.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/89 හා 2019 අගෝස්තු මස 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම</u>**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කර අංක 2137/89 හා 2019.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ හතරවන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදු කරනු ලැබේ.

**1. තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම**

1.1) 2019.02.26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019.02.26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1.2) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1හි අනු අංක (vi) යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුළ සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

1.3) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1හි අනු අංක (vi) යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුළ සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් සඳහා එම චක්‍රලේඛ සහ ඊට අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අදාළ වේ.

**2. දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම**

2.1) සේවා ව්‍යවස්ථාවේ හතරවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019.02.26 දිනට පෙර II ශ්‍රේණියේ සිටින නිලධාරීන්ට සහ III වන ශ්‍රේණියේ වසර හය(06)කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා පහත කරුණු අදාළ කරගනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1.1හි අනු අංක (v) යටතේ සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ගැනීම සඳහා II ශ්‍රේණියට උසස් වී වසර හත(07)ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය හෝ 2025.01.14 දිනය යන දින

දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා සහන කාලයක් ලබා දෙනු ලබන අතර එම සහන කාල සීමාව තුළදී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(ආ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස්වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1.1 හි අනු අංක (iv) යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ගැනීම සඳහා II ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර තුන(03)ක සහන කාලයක් ලබා දෙන අතර එම සහන කාල සීමාව තුළදී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

2.2) සේවා ව්‍යවස්ථාවේ හතරවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019.02.26 දිනට පෙර II ශ්‍රේණියේ සිටින නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී 10.2.1.1හි (i) සහ (iii) යටතේ සඳහන් සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ වසර දෙක(02)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා II ශ්‍රේණියට උසස් වීමෙන් පසු වැටුප් වර්ධක (02)ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව ii ශ්‍රේණියට උසස් වීමෙන් පසු උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙක(02)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන :

මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනට නිලධාරියෙකු II ශ්‍රේණියේ වසර 2කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යය සඳහා I ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලබයි.

2.3) සේවා ව්‍යවස්ථාවේ හතරවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019.02.26 දිනට පෙර III වන ශ්‍රේණියේ වසර හය(06)කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1හි දක්වා ඇති විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේ දී 10.2.1 හි (i) සහ (iii) යටතේ සඳහන් කර සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) III සහ II ශ්‍රේණිවල වසර දොළහ(12)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහ(11)ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දොළහ(12)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතියට අනුව නිකුත් කරනු ලැබේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය